**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව,**
**හම්බන්තොට දිස්ත්‍රික්කය.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජුනි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 20 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 168 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එය 2020 ජුනි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විෂයය නිලධාරියා නවක නිලධාරියෙකු වීම හා 2020 පෙබරවාරි 29 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට සිදු වීම මත මෙලෙස සිදු වූ බවත්, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නොවීමට වග බලා ගන්නා බව දන්වමි. |

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ජ්'නල් සටහන් 09 ක් කළ මහින් පොදු ලෙජරයේ ගිණුම්වලට අනුව ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.3,329,408 ක ශේෂයක් අඩුවෙන් හා රු.16,760 ක ශේෂයක් වැඩියෙන් දැක්වේ. | ලෙජර් ගිණුම්වල එකතුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ගත යුතුවේ. | ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේදි ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 225,054ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර තැන්පතු පොලී නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ පොළිය රු. 873,328 ක් බවත්, එම ශේෂයට ඉතිරි කිරීමේ ගිණුම්වල පොලිය වූ රු. 224,784 ක් ගිණුම්ගත කර ඇති බවත්, ඉදිරියේදි එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදි ඉදිකළ ව්‍යාපෘති 02 කට අදාළ රු. 1,947,454 ක් වූ වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | ඉකුත් වර්ෂයට අදාළ කර්මාන්ත ණයහිමි අධිවෙන්කිරීම් රු. 630,972 ක් සඳහා ගැලපීම් සිදු කර නොතිබුණි. | ණය හිමි ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 12 කට අදාළ එකතුව රු. 247,894,748 ක් වූ ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛන / ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුවෙහි රු. 314,942,883 ක් වූ අසමානතාවයක් පැවතුණි. | ගිණුමේ දැක්වෙන ශේෂ වලට අදාල උපයෝගී ලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර වෙනස් වූ ශේෂයන් හඳුනාගෙන ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට වෙනස් වෙමින් ඉදිරියට ගෙනෙන ලද රු. 192,872 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය නිරවුල් කර නොතිබුණි. තවද අවිනිශ්චිත ගිණුමේ ලෙජරයේ නිවැරදි එකතු වටිනාකම රු. 162,072 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.192,871 ක් ලෙස දැක්වීමෙන් රු. 30,800 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අවිනිශ්චිත ගිණුම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2018 දෙසැම්බර් 31 දින පැවති රු.303,668 ක ශේෂයෙන් රු.110,795 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ නිවැරදි කළ බවත්, ඉතිරි රු. 192,877 ක මුදල හඳුනාගැනීමෙන් පසුව නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතුව රු. 73,817,463 ක් වූ ගිණුම් විෂයයන් 30 කට අදාලව අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විස්තරාත්මක උපලේඛන ඉදිරියේදී ඉදිරිපත් කරන බවත්, අයිතිය තහවුරු කිරීම පිළිබඳ අදාල අංශ දැනුවත් කරමින් පවතින බවත්, වත්කම් සමීක්ෂණයද සිදු කරමින් නිවැරදි කිරීමට කටයුතු කරන බවත්, ගිණුම්වලට කරන ලද ගැලපීම් ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.5 අනුකූල නොවීම**

**1.5.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| i. | රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර තිබූ පුද්ගලයින් පිළිබඳව ලැයිස්තුවක් සකස් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වරිපනම් බදු ගෙවීම පැහැරහරින ලද පුද්ගලයන් සඳහා රතු නිවේදන නිකුත් කල බවත්, ඊට අදාල විස්තර වාර්තාවක් පිළිතුරු සමඟ ඉදිරිපත් කරමි. |
| ii. | රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී ලබා දීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| i. | මු.රෙ. 134 (3) | සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කාර්තු 03 ක් සඳහා අභ්‍යන්තර විගණන වාර්තා පිළිතුරු සමඟ ඉදිරිපත් කරන අතර, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නොවීමට වගබලා ගන්නා බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | මු.රෙ. 371 (5) | අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ විගසම පියවිය යුතු වුවත් ඉකුත් වර්ෂයන් වලදී ලබාදුන් වටිනාකම රු.168,639 ක අත්තිකාරම් සඳහා එපරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නොපියවූ අත්තිකාරම් ශේෂයෙන් රු. 36,000 ක අත්තිකාරමක් රු. 5,000 බැගින් මාසිකව අදාල නිලධාරියා විසින් ගෙවීම් කරන බවත්, අත්තිකාරම් මුදල් ලබා ගත් නිලධාරීන් වෙත අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කරන ලෙසට ලිපි යොමු කළ බවත්, රු. 82,771 ක නොපියවූ අත්තිකාරම් ඉතිරි ශේෂය පිළිබඳව ලේඛන පරීක්ෂා කර බලා විස්තරාත්මක උපලේඛනයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| iii. | මු.රෙ. 396 | වටිනාකම රු. 15,820 ක කල් ඉකුත් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | රු. 12,170 ක චෙක්පත් සඳහා දින දීර්ඝකර ගන්නා ලෙස ලිපි යවා ඇති බවත්, රු. 3,650 ක චෙක්පත් අවලංගු කර ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| iv. | මු.රෙ. 571 | වසර දෙක ඉක්මවූ වටිනාකම රු. 298,111 ක් වූ තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | රු. 17,818 ක සියයට 10 ක රැඳවුම් මුදල් සභා අරමුදලට ගෙන වාර්තා කරන බවත්, එක් තැන්පතුවක් නිදහස් කිරීමට කටයුතු කරන අතර, ආරක්ෂිත තැන්පතු වලට අදාලව මාර්ගවල අඩුපාඩු නිවැරදි කර දෙන ලෙස ගොවි සමිති වෙත ලිපි යවා ඇති අතර අඩුපාඩු නිවැරදි නොකරන්නේනම් සභා අරමුදලට ගැනීමට කටයුතු කරමි. |
| v. | මු.රෙ. 702 (3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි . | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් ඉදිරියේදී විගණනය වෙත එවීමට කටයුතු කරමි. |
| vi. | මු.රෙ. 1645 (ආ) , (ඇ) සහ 1646 | සභාවේ වාහන හා යන්ත්‍රෝපකරණ 17 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විෂයය නිලධාරී විසින් ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගැටළු ඇති වූ බවත්, එම වර්ෂවලට අදාල ධාවන සටහන් පසුව විගණනය වෙත යොමුකර ඇති බව දන්වමි. |
| (ඇ) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 ජනවාරි 30 දිනැති අංකPFD / RED / COPA / 2019 / 01 දරණ ලිපියේ 04 ඡේදය | ආකෘති ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | අදාල ලිපිය අනුව කටයුතු කළ යුතුවේ. | කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීමට දැනුමක් නොමැතිවීම හේතු වූ අතර, මේ පිළිබඳ පුහුණුවක් හෝ උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත්, ඒ පිළිබඳ දැනුමක් හා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පුහුණුවක් ලද පසු එම වාර්තාව සකස් කරන බව දන්වමි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො / 2010 / 01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය | සභාව සතු කඩ කාමර ක 230 ගිවිසුම් යාවත්කාලීනකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභාව සතු කඩ කාමර 468 න් කඩ කාමර 280 කට ආසන්න ප්‍රමාණයක ගිවිසුම් යාවත්කාලීන කර ඇති අතර, 2020 වර්ෂය අවසන් වන විට මුළු කඩ කාමර සංඛ්‍යාවෙන් සියයට 90 ක ප්‍රමාණයක ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම, රු. 9,710,039 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 20,997,078 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ සමුච්චිත අරමුදලේ ශේෂය රු. 11,578,806 ක ඍණ අගයක් විය. | සමුච්චිත අරමුදල් ශේෂය ඍණ අගයක් නොගත යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ අවසානයට සමුච්චිත අරමුදලේ ශේෂය පෙර වර්ෂයේ ශේෂයට වඩා අඩු අගයක් ගෙන ඇති අතර, පෙර වර්ෂ සඳහා ගැලපීම් සිදු කිරීම හේතුවෙන් ශේෂය ඍණ අගයක් වී ඇති බව දන්වමි. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස් කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,922,970 | 3,321,651 | 2,988,195 | 3,702,655 | 2,872,000 | 3,021,970 | 2,815,626 | 3,223,896 |
| කුලී | 15,553,310 | 14,787,340 | 15,673,894 | 3,360,498 | 10,351,300 | 14,715,167 | 12,665,597 | 3,372,682 |
| බලපත්‍ර ගාස්තු | 13,570,500 | 10,676,563 | 11,174,593 | 782,341 | 13,150,000 | 16,708,495 | 15,520,979 | 1,291,016 |
| වෙනත් ආදායම් | 25,824,600 | 29,500,912 | 28,202,174 | 31,301,055 | 30,163,900 | 26,802,429 | 23,456,152 | 22,153,406 |
| | 57,871,380 | 58,286,466 | 58,038,856 | 39,146,549 | 56,537,200 | 61,248,062 | 54,458,354 | 30,041,000 |

**2.3.2 වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වරිපනම් බදු රු. 3,056,795 ක් අය කර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158(1) (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු වරිපනම් බදු ශේෂයෙන් රු. 204,022 ක් අයකරගත් බවත්, ඉතිරි වරිපනම් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය පරිදි සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ කාලීනව හඳුනා ගෙන වරිපනම් අය කළ හැකි වුවත් එපරිදි කටයුතු නොකර 1976 වර්ෂයේ දී හඳුනා ගත් දියුණු කළ ප්‍රදේශ සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේදීත් වරිපණම් බදු අය කර තිබීමෙන් නව දියුණු කළ ප්‍රදේශ හඳුනා නොගත් කාල පරාසය වර්ෂ 44 ක් විය. | පනත අනුව කටයුතු කළ යුතුවේ. | දියුණු කළ ප්‍රදේශ 06 ක් හඳුනාගෙන ඇති අතර, එම බල ප්‍රදේශයේ සිතියම සකස් කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට ලිපි මඟින් ඉල්ලීම් කර ඇති බව සහ පසුව ඉදිරි කටයුතු සිදු කරන බවත්, එම ප්‍රදේශ වල මහජන සෞඛ්‍ය සහ පොදු පහසුකම් සංවර්ධනයට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව දන්වමි. |
| (ඇ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන පනතේ 20 වෙනි වගන්තිය පරිදි වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත් 2007 වර්ෂයේ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේදීත් බදු අයකර තිබුණි. | පනත අනුව කටයුතු කළ යුතුවේ. | තක්සේරු වාර්තා ලබා දෙන ලෙස 2012 වර්ෂයේ සිට ඉල්ලීම් කළද මෙතෙක් තක්සේරු වාර්තා ලබා දී නොමැති බව දන්වමි. |

**2.3.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු කඩ කාමර කුලී රු. 3,277,340 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද කඩ කුලී හිඟ සිටි කාල පරාසය මාස 02 ත් මාස 40 ත් අතර විය. | හිඟ කුලී ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විගණන ඡේදය පිළිගන්නා බවත්, සමාලෝචිත වර්ෂයේ සමස්ත කඩ කුලී අය කිරීම් රු. 7,244,836 ක් බව දන්වමි. |

### 2.3.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු හා වෙළෙඳ බදු පිළිවෙලින් රු. 185,326 ක් හා රු. 349,920 ක් අය කර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි. | හිඟ බලපත්‍ර හා වෙළඳ බදු ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු වෙළඳ බලපත්‍ර හා වෙළඳ බදු පිළිවෙලින් රු. 131,576 ක් හා රු. 77,040 ක් අයකරගෙන ඇති බව සහ ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට ආදායම් පරීක්ෂක වෙත වගකීම් පවරා ලිපි යොමුකර ඇති බව දන්වමි. |

### 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 4,613,127 ක් හා රු. 25,145,775 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අදාල බලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට හිඟ මුද්දර ගාස්තු රු.7,700,000 ක් අයකරගෙන ඇති බවත්, ඉතිරි මුද්දර ගාස්තු හා හිඟ උසාවි දඩ ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කරුණු 29 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා 29 ක් පනවා ගෙන ඇති බව දන්වමි. |

**(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 වර්ෂයේදී ආරම්භ කළ තිස්සමහාරාම තරුණ කටයුතු සඳහා පොදු සේවා මධ්‍යස්ථානයක් ඉදි කිරීමේ කර්තව්‍යය සඳහා රු. 563,997 ක් වැය කළද අපේක්ෂිත ප්‍රතිඵල ලබානොගෙන ව්‍යාපෘතිය අතරමඟ නතර කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ සංවර්ධන කටයුතු වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතුවේ. | සභාවේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් අදාල ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට නොහැකි වූ බවත්, ප්‍රතිපාදන ලැබීමෙන් පසු වැඩ ආරම්භ කර ජනතා අයිතියට පත් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් එකතු වටිනාකම රු. 3,100,000 ක් වූ සංවර්ධන යෝජනා 03 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන මුදල් සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට නොපමාව සිදුකල යුතුවේ. | අයවැය මඟින් ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කලද සභාව සතුව ප්‍රතිපාදන පවතින්නේ නම් ආරම්භ කර අවසන් කරන අතර, සමාලෝචිත වර්ෂයේ රටේ පැවති අයහපත් තත්ත්වය මත සභාවට ලැබුණු ආදායම පහල මට්ටමක පැවතීම නිසා අදාල ව්‍යාපෘති සිදු නොකල බව දන්වමි. |

**(ඈ) තිරසර සංවර්ධන අභිමථාර්ත ඉටු කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශන පිළිබඳ දැනුවත්භාවය ලබා ගෙන ඉදිරියේදී බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වූ දිගු කාලීන සැලසුම් සකස් කරන බව දන්වමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ ඉදි කරනු ලබන අනවසර ඉදි කිරීම් හඳුනා ගැනීම හා වැලැක්වීම සඳහා පත් කළ කමිටුවේ වාර්තා අධීක්ෂණයට ලක්කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කළ යුතුවේ. | නාගරික සංවර්ධන අධිකාරිය හා තාක්ෂණික සේවා නිලධාරීන් සමඟ අනවසර ඉදිකිරීම් පරීක්ෂා කිරීම සිදු කරන බවත්, පනතේ විධිවිධාන අනුව ඉදිකිරීම් කිරීමට උපදෙස් දෙන බවත්, එසේ නොවන්නේ නම් ඉදිකිරීම් තහනම් කිරීම සිදු කරන බවත්, අනවසර ඉදි කිරීම් හඳුනා ගැනීම හා වැලැක්වීම සඳහා සමීක්ෂණය කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බවත් දන්වමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

#### 3.3.1 සේවක පුරප්පාඩු හා අතිරික්තතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 24 ක් පිරවීමට හා අතිරික්තතා 44 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ද්විතීක මට්ටමේ තනතුරුවල පුරප්පාඩු සපුරා දෙන ලෙස ඉල්ලීම් කර ඇතත්, එම ඉල්ලීම් ඉටු වී නොමැති බවත්, අභ්‍යාසලාභී පුහුණු නිලධාරිනියක් පමණක් අනුයුක්ත කර ඇති බවත්, 25/2014 චක්‍රලේඛයට අනුව තනතුරු 21 ක් ස්ථිර කිරීමට අනුමැතිය ලැබී ඇති බව දන්වමි. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් හා මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මානව සම්පත් සැලැස්ම සකස් කිරීම පිළිබඳ අවබෝධයක් නොමැති වීම හේතුවෙන් එය පිළියෙල නොකළ අතර, සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම සඳහා විෂය නිලධාරී වෙත වගකීම් පවරා ඇති බව දන්වමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභා බල ප්‍රදේශයේ පිහිටි ව්‍යාපාර ස්ථාන හඳුනා ගැනීමට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | කාලීනව සමීක්ෂණ සිදු කළ යුතුවේ. | ඉදිරියේදී ව්‍යාපාරික ස්ථාන පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් සහ සමාලෝචිත වර්ෂයේදී ධාවනයෙන් ඉවත් කළ වාහන 09 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාල වාහන අළුත්වැඩියා කිරීමට ප්‍රතිපාදන නොමැති අතර, ප්‍රතිපාදන සලසා අළුත්වැඩියා කිරීමට හෝ අවශ්‍ය නිර්දේශ ලබා ගෙන ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.5.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් බුක්ති විඳින ඉඩම් 165 ක හා වාහන 09 ක ලියාපදිංචි අයිතිය පවරා ගෙන නොතිබුණි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් 03 ක් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් විසින් ලිඛිතව භාර දී ඇති බවත්, ඉතිරි ඉඩම් 162 ක අයිතිය විධිමත්ව පවරා ගැනීම සඳහා දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යංශය වෙත යොමු කර ඇති බවත්, සභාව දීර්ඝ කාලයක සිට භුක්ති විඳින ඉඩම් 02 ක් හා වාහන 06 ක් පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බවත්, වාහන 03 ක් පවරා ගැනීමට අදාල තොරතුරු නොමැති බව දන්වමි. |

### 3.5.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු වටිනාකම රු. 3,467,500 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 06 ක් භාවිතයෙන් තොරව නිශ්ක්‍රීයව පැවතුණි. | සභාව සතු වත්කම් ඵලදායීව යෙදවිය යුතුවේ. | ස්ථාවර වත්කම් සමීක්ෂණය මේ වන විට සිදු කරනු ලබන බවත්, එම නිර්දේශ අනුව සභාව සතු |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පවතින ඉඩම් හා ගොඩනැගිලි ඵලදායීව යොදා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව සතු එන්ජිම සහිත බෝට්ටු 02 ක්, මහන මැෂින් 11 ක්, ජෙනරේටරයක්, කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රයක්, ගල් ක්‍රෂර් යන්ත්‍රය සහ කිලෝ ග්‍රෑම් 50 ක ධාරිතාවෙන් යුක්ත බොල්වීල් යන්ත්‍ර 02 ක් දීර්ඝ කාලයක සිට නිශ්කාර්යව පවතින අතර ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු වත්කම් ඵලදායීව යෙදවිය යුතුවේ. | කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රය ටෙන්ඩර් කර එමඟින් සභාවට ආදායමක් ලබා ගැනීමටත්, බෝල්වීල් යන්ත්‍ර 02 අඩු ආදායම්ලාභී ස්වයංරැකියා කරනු ලබන පවුල් 02 කට ගිවිසුමක් යටතේ ලබා දීමටත්, එන්ජිම සහිත බෝට්ටු 02 ක ධීවර සමිති වෙත කුලියට ලබා දීමටත්, මහන මැෂින් 11 ක් ස්වයංරැකියාලාභීන් වෙත ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය අනුව ලබා දීමට කටයුතු කරමි. |

**3.6 ප්‍රසම්පාදනය**

----------------

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 වර්ෂයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොමැති අතර, 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමැතිය ලබා ගෙන ඉදිරිපත් කරමි. |